# 19

# කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමා

" إِنَّ اللَّهَ جَعَلَ الْحَقَّ عَلَى لِسَانِ عُمَرَ وَقَلْبِهِ " (رواه الحاكم)

**"නිශ්චිත වශයෙන් අල්ලාහ් විසින් උමර්ගේ සිත්හි හා දිවෙහි සත්‍යය තබා ඇත." (හාකිම්)**

ඉස්ලාමීය රාජ්‍යයේ කලීෆාවරුන් අතර දෙවන්නා වූ උමර් රළියල්ලාහු අන්හු තුමා "අදී" පරම්පරාවේ ක්‍රි. ව. 580 දී උපත ලබන ලදි. මල්ලව පොර වීරයෙකු ලෙස ද සාක්ෂරතාවෙයන් ද යුක්ත ව සිටි මොහු ආරම්භයේ දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ ද ඉස්ලාමයේ ප්‍රමුඛ පෙළේ සතුරන්ගෙන් කෙනෙකු ලෙස සිටියේ ය. මක්කාවේ සාමය ඇති කිරීමට සුදුසු ම විසඳුම, නබිවරයා මැරීම බව කුරෛෂිවරු තීරණය කළ අවස්ථාවෙහි එය ඉටු කිරීමට උමර් රළියල්ලාහු තුමා ඉදිරිපත් විය. ඒ සඳහා නබි තුමා වෙත යන විට හිදයත් ලැබී නුබුවතයෙන් පසු 6වන වසරේ දී ඉස්ලාමය වැළඳගත්තේ ය.

## පෞරුෂ ලක්ෂනය

පෞරුෂ ගුණාංගවලින් යුක්ත උමර් රළියල්ලාහු අන්හු තුමා ඉස්ලාම් ධර්මය වැළඳ ගැනීම, මුස්ලිම්වරුන් අතර ප්‍රබෝධය හා උද්යෝගය ඇති කිරීමට හේතු වුණි. නමුත් එය කුරෛෂි කාෆිර්වරුන්ට දරුණු පහරක් විය. උමර් රළියල්ලාහු අන්හු තුමා ඉස්ලාම් දහම වැළඳ ගත්තායින් පසු පමා නොවී සෑම කුරෛෂි නායකයකුගේ ම නිවසට ගොස් තට්ටු කර තමා මුස්ලිම්වරයකු වූ බව දන්වා කාබාවේ දී ද එසේ ප්‍රකාශයට පත් කළේ ය. ඉන්පසු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ කුඩා කණ්ඩායම් ලෙස සිටි මුස්ලිම්වරු කැඳවා කඃබාවෙහි ප්‍රසිද්ධ ව සලාතය ඉටු කිරීමට යන වග පැවසුවේ ය. මෙය දැක කුපිත වූවත් උමර් රළියල්ලාහු අන්හු තුමාට විරුද්ධ ව ක්‍රියා කිරීමට මුෂ්රික්වරු එඩිතර නොවූහ.

උමර් රළියල්ලාහු අන්හු තුමා දුන් උපදෙස් ස්ථිර කරමින් බොහෝ අවස්ථාවල වහී පහළවීම, මොහුගේ පුළුල් දැනුම, නුවණ පෙන්වයි. අබූබක්ර් රළියල්ලාහු අන්හා තුමාට නොමිලේ බෙදහැරීම සඳහා

අල් කුර්ආනය ග්‍රන්ථාරූඪ කර ආරක්ෂා කිරීමට උපදෙස් ලබා දීම. මොහුගේ බුද්ධියත් දුර දක්නා නුවණක් පෙන්වන විශිෂ්ට නිදර්ශනයකි.

## කලීෆා වශයෙන් පත්වීම

තමන්ගේ අවසන් කාලය දැනගත් අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමන් තමන්ගේ මරණයට පෙර උමර් රළියල්ලාහු අන්හු තුමා කලීෆා ලෙස පත්කිරීමට කැමැති වූහ. ඒ පිළිබඳ එකල සමාජයේ ප්‍රමුඛ පෙළේ සහාබාවරු තනි තනිව හා කණ්ඩායම් වශයෙන් කැඳවා සාකච්ඡා කළේ ය. සියල්ලෝ ම උමර් රළියල්ලාහු අන්හු තුමාගේ නායකත්වය පිළිබඳ සම්පූර්ණ සම්මුතිය ප්‍රකාශ කළහ. ඒ අනුව අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාණන් උමර් රළියල්ලාහු අන්හු තුමා ව කලීෆාවරයෙකු ලෙස ප්‍රකාශයට පත් කළේ ය. ජනතාව ද එය ඒකමතික ව පිළිගත්හ.හිජ්රි 13හි දී ජමාදුල් ආඛිර් 22 වෙනි දිනහි කිලාෆතය බාරගත්තේ ය.

## සේවාව හා දයකත්ව

රෝමය හා පර්සියානු රාජ්‍ය නායකයන්ගේ දැඩි පාලනයට නතු වූ ජනතාව එයින් මුදවා ඒ අය වෙනුවෙන් ප්‍රබෝධවත් ජීවන රටාවක් ඇති කිරීම සඳහා අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාණන් ඇරඹූ කිලාෆතය පුළුල් කිරීමේ ක්‍රියාවලිය පෙරට ගෙන ගියේ ය. ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ආණ්ඩුකාරවරුන් ලෙස පත්කර පරිපාලන කටයුතු සංවිධානය කළේ ය. විවිධ මාර්ග ඔස්සේ ජනතාවගේ අඩුපාඩු දැන ගෙන ඒවාට වහා ම විසඳුම් ලබා දුන්නේ ය. ඉතා අවංක හා සාධාරණ වූ මෙතුමන්ගේ පාලන තන්ත්‍රයේ සාධනීය බලපෑම් හේතුවෙන් ඉස්ලාමිය රජය යටතේ ජීවත් වීමට අසල් වැසි රටවල්වල සිටින ජනතාවට ද ලැදියාවක් දක්වූහ.

කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමාගේ පාලනයේ දී ඉස්ලාමීය රාජ්‍ය ප්‍රමාණය කිහිප ගුණයකින් විශාල වූ නිසා පරිපාලනය නිවැරදි ව මෙහෙයවන්න ව්‍යුහ ගතකරණය හඳුන්වා දීමට වුවමනා විය. එය පදනම් කරගෙන බොහෝ නව සංවිධානාත්මක ක්‍රම හඳුන්වා දෙන ලද්දේ ය.

1. කලීෆා තුමාගේ අයිතිවාසිකම්, යුතුකම්, ජනතාව අතර තිබිය යුතු සම්බන්ධකම් යනාදියට සීමා ඇති කිරීම.
2. ආණ්ඩුකාරවරුන් පත් කිරීමේ විධිවිධාන ද හඳුන්වා දී මොවුන්ගේ බලය ද සීමා කිරීම.
3. නීති ක්ෂේත්‍රය ස්වාධීනව ක්‍රියා කර වීම.
4. රජයේ බදු අය කිරීමට නිලධාරින් පත්කිරීම
5. පරිපාලන කටයුතු සරල කිරීමට ප්‍රාදේශීය මට්ටමේ බොහෝ පරිපාලන ඒකක ඇති කර ඒවාට,

    වාලි : ආණ්ඩුකාරයා
    කාතිබ් : ප්‍රදාන ලේකම්

| | |
|---|---|
| කාතිබුද් දීවාන් | : හමුදා ලේකම් |
| සාහිබුල් හරාජ් | : දේශීය බදු රැස් කරන නිලධාරි |
| සාහිබුල් අහ්දාද් | : පොලිස් අධිකාරි |
| සාහිබු බෛතුල් මාල් | : භාණ්ඩාගාර ලේකම් |
| කාළී | : ප්‍රධාන නඩුකාරතුමා |

යනාදිවරුන් පත්කිරීම

6. බෛතුල්මාල් ස්ථාපනය කර, සකාත්, ජිස්යා, ගනීමත් හා කරාජ් අය කර ගැනීම ද වාරිස් නමැත්තන් අත්හැර ගිය දේපලවල් මගින් ඊට සරිලන ආදායම් මාර්ග ඇති කිරීම ද සිදු කළේ ය.
7. සංවිධානාත්මක ව හමුදාව ගොඩ නැඟීම.
8. ඉස්ලාමීය ඉතිහාසයේ ප්‍රථමයෙන් ම මුදල් කාසි ලෙස මුද්‍රණය කර නිකුත් කිරීම.
9. නගර නිර්මාණය, සෞඛ්‍යය සේවා, වාරිමාර්ග පහසුකම් ඇති කිරීම.
10. හිජ්රි දින දර්ශනය (කැලැන්ඩරය) හඳුන්වා දීම.

මෙවැනි බොහෝ සංවිධාන ක්‍රම හා සේවා ලබාදුන් කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමා මුළු මිනිස් සාමාජයට ම ආදර්ශවත් ලෙස රාජ්‍ය පාලනයක් ගෙන ගියේ ය. කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමා අවුරුදු 10 1/2ක පාලනයෙන් පසු හිජ්රි 23 දුල්හජ් හඳ 26 දී අබූ ලුඃලුආ නම් වූ පර්සියානු මජූසි වරයකුගේ පහර දීමෙන් තුවාළ වී අභාවප්‍රාප්ත විය.

## පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

❁ العَدِيّ ❁ الوَالِي ❁ الكاتِبُ ❁ كاتِبُ الدِّيْوانِ ❁ صَاحِبُ الأَحْدَادِ ❁ صَاحِبُ الخَرَاجِ
❁ صَاحِبُ بيْتِ المَالِ ❁ القاضِيْ ❁ الجِزْيَةُ ❁ الغَنِيْمَةُ ❁ الخَرَاجُ ❁ أبو لُؤْلُؤة

## අභ්‍යාසය

1. උමර් රළියල්ලාහු අන්හු තුමාගේ පෞරුෂ ගුණාංග සමහරක් සඳහන් කරන්න
2. මෙතුමා ඉස්ලාමය වැළඳගත්තායින් පසු ව මුස්ලිම්වරුන් පුණර්ජීවයක් ලැබූහ, යන්න ගැන පැහැදිලි කරන්න.
3. උමර් රළියල්ලාහු අන්හු තුමාව කලීෆා වශයෙන් තෝරා ගැනීම සිදුවූයේ කෙසේ ද යන්න සඳහන් කරන්න.
4. උමර් රළියල්ලාහු අන්හු තුමා පාලන වගකීම් භාරගෙන ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණයන් ගැන ලියන්න.